Australian Electoral Commission

Sinhalese/සිංහල

# ඔබේ නිල උපදෙස් පෙළ

## 2025 මහ මැතිවරණය සඳහා

**2025 මැයි මස 3 වන සෙනසුරාදා**

**චන්දය භාවිතාව අනිවාර්යයි**

අවුරුදු 18ට හා ඊට වැඩි වයසැති ඔස්ට්‍රේලියානුවන් සඳහා




## ඔබේ චන්දය ඔස්ට්‍රේලියාවෙහි හැඩගැස්වීමට දායකවනු ඇත

# වැඩබලන මැතිවරණ කොමසාරිස්වරයාගේ **පණිවුඩය**

මෙම මාර්ගෝපදේශයෙහි තොරතුරු මූලාශ්‍ර පරීක්ෂා කරන්නේ කෙසේද සහ ඔබේ ඡන්ද ගණන් කරන්නේ කෙසේද යන්න පිළිබඳ උපදෙස්, ඡන්ද මධ්‍යස්ථානයකදී සිදුවන දේ පැහැදිලි කිරීම සහ නිතර අසන ප්‍රශ්නවලට පිළිතුරු ඇත.

සිය ස්ථාවරය ප්‍රකාශ කිරීමට ප්‍රජාවට සහය වන අතරම අනෙකුත් චන්ද විකල්පයන්ද සමගින් චන්දය ප්‍රකාශ කරන ස්ථානයන් රට පුරා මැතිවරණ දිනයෙහිදී අප විවෘතව තබන්නෙමු.

චන්ද පත්‍රිකාව - මුද්‍රණයේ සිට ගණන්කිරීම දක්වා ඔබේ චන්දය එකී ක්‍රියාදාමයේ සෑම පියවරකදීම සුරකින **අද්විතීය** මැතිවරණ ක්‍රියාදාමයක් අප එළිදක්වන බවට ඔබ තුල ඇති විශ්වාසය තහවුරු වනු ඇත.

අදහස්වල ශක්තිමත් හුවමාරුව මැතිවරණයේ කොටසක් වන අතර, ඔබ ලබන සෑම තොරතුරක්ම, විශේෂයෙන්ම අපේ මනා ලෙස ස්ථාපිත මැතිවරණ ක්‍රියාදාමය ප්‍රශ්ණයට ලක්කෙරෙන යමක් නම්, එය සුපරීක්ෂාකාරීව සලකා බලන ලෙසත් මා ඔබ දිරිමත් කරමි.

**එය හඳුනාගත හැකි සහ විශ්වසනීය මාර්ගයකින් ලැබුනක්ද යන වග ඔබෙන්ම විමසන්න.** පිළිතුර නැත යන්න නම්, මගේ යෝජනාව වන්නේ පරීක්ෂාකාරීවන්න යන්නයි.

ඔබ ඡන්ද මධ්‍යස්ථානයකට ඇතුළු වූ විට, අපගේ කාර්ය මණ්ඩලය ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලිය සඳහා ඔබට උපකාර කිරීමට සිටින එදිනෙදා ඕස්ට්‍රේලියානුවන් බව කරුණාවෙන් මතක තබා ගන්න.

මේ මැතිවරණයේදී ඔබේ මතය තහවුරු කල හැකි අයුරු පිළිබඳ වැඩිමනත් තොරතුරු සඳහා **aec.gov.au** වෙත පිවිසෙන්න.

**Jeff Pope**
වැඩබලන මැතිවරණ කොමසාරිස්

මැතිවරණ ලේඛණය මත **97%** කට වඩා සුදුසුකම් ලැබූ චන්දදායකයින් ඡන්ද නාම ලේඛනයේ

චන්දය ප්‍රකාශ කරන ස්ථාන **7,000+**

පෙර චන්ද ප්‍රකාශ මධ්‍යස්ථාන **500+**

තාවකාලික මැතිවරණ සේවකයින් **100,000+**

# **නැවතී සලකා බලන්න**
## මෙවර මහ මැතිවරණය පිළිබඳ මූලාශ්‍ර පිරික්සන්න

මහ මැතිවරණ කාලය පරිච්ඡේදය අතරතුර ඔබේ චන්දයට බලපෑම් කිරීමට නිර්මාණය කල, විශාල ප්‍රමාණයක තොරතුරු බෙදාහරිනු ඇත.

විවිධ මූලාශ්‍රවලින් ලැබෙන තොරතුරු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියේ වැදගත් අංගයකි. එය අපේක්ෂකයින්ට, දේශපාලන පක්ෂවලට සහ අනෙකුත් අයට ඔවුන්ගේ ප්‍රතිපත්ති සහ විශ්වාසයන් ඡන්දදායකයින් සමඟ සන්නිවේදනය කිරීමට මාර්ගයක් සලසා දෙයි.




කෙසේ වෙතත්, සමහරක් තොරතුරු හිතාමතාම සාවද්‍ය හෝ නොමග යවන සුලු ඒවා විය හැක. මහ මැතිවරණය පිළිබඳ ඔබ දකින, අසන හෝ කියවන දෑ සුපරීක්ෂාකාරීව සලකා බැලීම වැදගත්ය.

සලකාබැලීමට කාලය වැය කරන්න:

- තොරතුරු පැමිණියේ **කොහෙන්ද**? එය විශ්වාස කළ හැකි මාධ්‍ය ආයතනයකින් හෝ නිල සමාජ මාධ්‍ය ගිණුමකින්ද?
- එය ප්‍රකාශයට පත් කළේ **කවදාද**? තවදුරටත් නිවැරදි නොවන පැරණි තොරතුරු නව තොරතුරු ලෙස පෙනෙන පරිදිද බෙදාහරිනු ඇත.
- ඔබට විශ්වාස නැතිනම් **පරීක්ෂා කරන්න**. කෘත්‍රිම බුද්ධි තාක්ෂණය මගින් ඡන්ද ක්‍රියාවලිය පිළිබඳ අසත්‍ය තොරතුරු නිර්මාණය කිරීම පහසු කරයි.

මහමැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ ඔබට අවිශ්වාසී යමක් ඔබ දුටුවහොත්, AEC වෙතින් විමසන්න. සමාජ මාධ්‍යවල සහ අන්තර්ජාලයේ ඔබ නෙත ගැටෙනු ඇති තොරතුරු සමඟ මෙය විශේෂයෙන් වැදගත් වේ. වැඩිදුර සහ ප්‍රයෝජනවත් තොරතුරු සහිත කෙටි විඩියෝ සඳහා **aec.gov.au/stopandconsider** වෙත පිවිසෙන්න.

# 2025 මැයි මස 3 වන සෙනසුරාදා මැතිවරණ දිනයයි

## චන්දය ප්‍රකාශ කරන ස්ථානයන් පෙ.ව.8 ට විවෘත වන අතර ප.ව.6 ට අනිවාර්යයෙන් වසනු ලැබේ.

මහ මැතිවරණයක් පවත්වනු ලබන්නේ චන්දදායකයින්ට සෙනෙට් සභාවේදී හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී තම අදහස් හා අවශ්‍යතා නියෝජනය කිරීමට සභිකයන් තෝරා පත්කර ගැනීමටය. ඡන්දය ප්‍රකාශ කිරීමේදී ඔබ දැනගත යුතු කරුණු කිහිපයක්.

### ඡන්දය ප්‍රකාශ කල යුත්තේ කවුද?

අවුරුදු 18ක් හා ඊට වැඩි වයසේ සියලු ඔස්ට්‍රේලියානු පුරවැසියන් අනිවාර්යයෙන් ලියාපදිංචි විය යුතු අතර මහ මැතිවරණයන්හිදී චන්දය ප්‍රකාශ කල යුතුය.

### මා හට චන්දය ප්‍රකාශ කළ හැක්කේ කොතැනදීද?

මැතිවරණ දිනයෙහිදී ඔබේ ප්‍රාන්තයේ හෝ ටෙරිටරියේ ඕනෑම චන්දය ප්‍රකාශ කරන ස්ථානයක ඔබට චන්දය ප්‍රකාශ කල හැක. චන්දය ප්‍රකාශ කරන ස්ථානයන් පෙ.ව.8 සිට ප.ව.6 දක්වා විවෘතව පවතී.

චන්දය ප්‍රකාශ කරන ස්ථානයන් සාමාන්‍ය වශයෙන් ප්‍රාදේශීය පාසල්, පල්ලිවල සහ ප්‍රජා ශාලා සහ පොදු ගොඩනැගිලිවල ස්ථානගත කර ඇත.

ඔබට ආසන්නම චන්දය ප්‍රකාශ කරන ස්ථානය සොයා ගැනීමට **aec.gov.au/where** වෙත පිවිසෙන්න.

### මාහට සහය අවශ්‍ය නම්?

ඔබට ගමන් අවහිරතාවන් හෝ දුබලතාවන් ඇත්නම්, හෝ එවැන්නෙකු රැකබලා ගන්නෙකු නම්, චන්දය ප්‍රකාශ කරන ස්ථානයන්ට ළඟාවිය හැකි අයුරු පිළිබඳ තොරතුරු **aec.gov.au/where** මගින් සොයා දැනගත හැක.

දෘශ්‍යාබාධිත හෝ මන්ද දෘශ්‍යාබාධිත චන්දදායකයන් හට සහයවන චන්දය ප්‍රකාශකිරීමේ විකල්පයන් ඇත. **aec.gov.au/assistance** වෙත පිවිසෙන්න නැතිනම් අංක **13 23 26** අමතන්න.



### මා වෙනත් ප්‍රාන්තයක හෝ ටෙරිටරියක සිටී නම්?

මැතිවරණ දිනයෙහිදී ඔබ ප්‍රාන්ත අතර සිටිනු ඇති නම් ඔබට නම්කරන ලද අන්තර්ප්‍රාන්ත චන්ද මධ්‍යස්ථානයක චන්දය ප්‍රකාශ කිරීමේ සහ වේලාසනින් චන්දය ප්‍රකාශකිරීමේ විකල්පයන් සලකා බලන්න.

### මැතිවරණ දිනයේදී මා හට පැමිණිය නොහැකි නම්?

ඔබට මැතිවරණ දිනයේදී චන්ද ස්ථානයක් වෙත යා නොහැකි නම්, ඔබ පුද්ගලිකව හෝ තැපැල් මගින් චන්දය වේලාසනින් ප්‍රකාශකිරීමට සුදුසුකම් ලබනු ඇත.

#### වේලාසනින් පුද්ගලිකව චන්දය ප්‍රකාශ කරන අයුරු

ඔබ සුදුසුකම් ලබන්නේ නම්, ඔබට මැතිවරණ දිනයට පෙර ඡන්දය ප්රකාශ කළ හැකිය. මුල් ඡන්ද මධ්‍යස්ථාන **2025 අප්‍රේල් මස 22 වන අඟහරුවාදා සඳුදා** සිට විවෘත වේ. විවෘත කිරීමේ දිනයන් සහ වේලාවන් වෙනස් වන බැවින් එක් එක් මධ්‍යස්ථානය සඳහා තොරතුරු දැනගැනීමට **aec.gov.au/where** වෙත පිවිසෙන්න.

වේලාසන ඡන්දය ප්‍රකාශකිරීම සහ සුදුසුකම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා, **aec.gov.au/early** වෙත පිවිසෙන්න නැතහොත් **13 23 26** අමතන්න.

#### වේලාසනින් තැපැල් මගින් චන්දය ප්‍රකාශ කරන අයුරු

වේලාසනින් තැපැල් මගින් චන්දය ප්‍රකාශ කරන අයුරු **aec.gov.au/pva**

**2025 අප්‍රේල් මස 30 වන බදාදා ප.ව. 6** ඉක්මවීමට පෙර AEC වෙත අයදුම්පත් අනිවාර්යයෙන් ලැබිය යුතුය.

අන්තර්ජාලයට ප්‍රවේශයක් නොමැති නම් සහ ඔබට තැපැල් චන්දයක් සඳහා අයදුම්කිරීමට අවශ්‍ය නම් **13 23 26** අමතන්න.

ඔබට දේශපාලන පක්ෂයකින් හෝ වෙනත් සංවිධානයකින් තැපැල් ඡන්ද අයදුම්පතක් ලැබිය හැකිය. තෙවන පාර්ශවයන්ට මෙම අයදුම්පත් නිවෙස්වලට යැවීමට අවසර ඇති නමුත් ඔබට ඒවා භාවිතා කිරීමට අවශ්‍ය නොවේ. තැපැල් ඡන්ද කට්ටලයක් සඳහා ඔබට AEC වෙත කෙලින්ම අයදුම් කළ හැකිය.

### මා කුමන ඡන්ද කොට්ඨාශයට අයත්ද?

කුමන ඡන්ද කොට්ඨාශයට ඔබ ජීවත්වන්නේද යන්න **aec.gov.au/electorate** වෙතින් සොයාගත හැකිය.

ඔබේ ඡන්ද කොට්ඨාශයේ නම හෝ මායිම් පසුගිය මැතිවරණයෙන් පසු නැවත සළකුණු කිරීමේ හේතුවෙන් වෙනසකට ලක්වන්නට ඇත. මින් අදහස්වන්නේ ඔබට වෙනත් කොට්ඨාශයක චන්දය ප්‍රකාශකිරීමට අවශ්‍යවනු හෝ ඔබේ සාමාන්‍ය චන්දය ප්‍රකාශකරන ස්ථානය වෙනස් ඡන්ද කොට්ඨාශයක පැවතීමට ඉඩකඩ ඇති බවයි.

### ඔබ චන්දය ප්‍රකාශ කරන්නේ කාහටද යන්න ඔබේ තීරණයයි

ඔබ ඡන්දය දෙන ආකාරය ඔබේ තීරණය පමණයි. චන්ද මධ්‍යස්ථානයන්හි පිටතදී, අපේක්ෂක නියෝජිතයින්, "චන්දය ප්‍රකාශ කල හැක්කේ කෙසේද" යන, යම් අයුරකට චන්දය ප්‍රකාශ කිරීමට දිරිදෙන කාඩ්පත් ඔබට පිරිනමනු ඇත. ඔබ ඒවා භාරගැනීමට හෝ "චන්දය ප්‍රකාශ කල හැක්කේ කෙසේද" යන කාඩ්පත් අනුගමනය කිරීමට අවශ්‍ය නැත.

වෙනත් ප්‍රශ්ණ තිබේද?
**aec.gov.au/faqs** වෙත පිවිසෙන්න

# චන්දය ප්‍රකාශ කරන ස්ථානයේදී කුමක් සිදුවේද?

ඔබ ඡන්ද මධ්‍යස්ථානයකට පැමිණි විට, මැතිවරණ නිලධරයකු ඔබගේ සම්පූර්ණ නම සහ ලිපිනය ඉල්ලා සිටිනු ඇති අතර, ඔබ මීට පෙර 2025 මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කර තිබේද යන්න විමසනු ඇත.

- ඔබගේ නම ඡන්ද හිමි නාමලේඛනයෙන් ඉවත් කරනු ලැබේ.
- නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සඳහා ඡන්ද පත්‍රිකාවක් සහ සෙනෙට් සභාව සඳහා ඡන්ද පත්‍රිකාවක් ඔබට ලබා දෙනු ඇත.
- ඔබේ ඡන්ද පත්‍රිකා නිවැරදිව සම්පූර්ණ කිරීමට එහි ඇති උපදෙස් අනුගමනය කරන්න, නැතහොත් මැතිවරණ නිලධරයකුගෙන් සහය ඉල්ලා සිටින්න.
- ඔබ ඔබේ ඡන්ද පත්‍රිකා සම්පූර්ණ කළ පසු, ඒවා ඡන්ද පෙට්ටියට දමන්න.
- ඔබ AEC පැන්සලක් භාවිතා කර ඇත්නම්, එය පිටතට යන විට ඇති පෙට්ටියට දමන්න.

මනා සෞඛ්‍යාරක්ෂාව දිරිමත් කරනු ලබන අතර අත් සනීපාරක්ෂක දියර ලබා දෙනු ඇත.

## අපගේ කාර්ය මණ්ඩලය ඇත්තේ ඔබට උදව් කිරීමටය. කරුණාකර විනීත වන්න.





# ඔබේ චන්දය වලංගුකර ගත හැකි අයුරු

ඔබට නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සඳහා කොළ පැහැති කුඩා එකක්ද, සෙනෙට් සභාව සඳහා සුදු පැහැති විශාල එකක්ද වශයෙන් චන්ද පත්‍රිකා දෙකක් ලැබෙනු ඔබට ඇත. **ඔබ චන්ද පත්‍රිකා දෙකම සම්පූර්ණ කල යුතුමය.** කොළ පැහැති චන්ද පත්‍රිකාවේ, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නගරබද ප්‍රදේශයේ හෝ මැතිවරණ කොට්ඨාශයේ නියෝජිතයකු සඳහා ඔබ චන්දය භාවිතා කරයි. සුදු පැහැති චන්ද පත්‍රිකාව මත, ඔබේ ප්‍රාන්තයේ හෝ ටෙරිටරියේ සෙනෙට් සභාවේ නියොජිතයන් සඳහා ඔබ චන්දය ප්‍රකාශ කරයි.

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

කොල පැහැති චන්ද පත්‍රිකාව මත, ඔබේ මනාපය පරිදි, **සියලුම කොටු අංකනය කරන්න**. ඔබේ පළමු තේරීම වන අපේක්ෂකයා සඳහා කොටුවේ ‘1’ අංකයද, ඔබේ දෙවන තේරීම සඳහා ‘2’ අංකය යනාදී ලෙස සියලු කොටු අංකනය කර අවසන්වනතුරු ලකුණු කරන්න.




චන්ද පත්‍රිකා නියැදිය

AEC වෙබ් අඩවියේ චන්දය ප්‍රකාශකිරීමට ඔබට පුහුණු විය හැකි බව ඔබ දැනසිටියාද? **aec.gov.au/practise** වෙත පිවිසෙන්න.

## සෙනෙට් සභාව


සුදු පැහැති චන්ද පත්‍රිකාවේ චන්දය ප්‍රකාශකිරීමට දෙආකාර මනාපයන් ඔබට ඇත:

**එක්කෝ**

### සීමා රේඛාවට ඉහළින්

රේඛාවට ඉහළින් චන්දය ප්‍රකාශකිරීමට ඔබ තීරණය කළහොත්, **අවම වශයෙන් කොටු 6ක් ඔබ අංකනය කළ යුතුය.**

ඔබේ පළමු මනාපය හිමි පක්ෂය හෝ කණ්ඩායම සඳහා ඇති කොටුවෙහි ‘1’ ද දෙවැනි මනාපයට අයත් කොටුවෙහි ‘2’ ලෙසින්ද අවම වශයෙන් කොටු 6ක් ඔබ අංකනය කළ යුතුය. රේඛාවට ඉහළින් කැමති කොටු ප්‍රමාණයක ඔබට දිගටම අංක ලකුණු කළ හැක.





චන්ද පත්‍රිකා නියැදිය

**නැතහොත්**

### සීමා රේඛාවට පහළින්

රේඛාවට පහළින් ඡන්දය ප්‍රකාශකිරීමට ඔබ තීරණය කළහොත්, 1 සිට 12 දක්වා පුද්ගලික අපේක්ෂකයින් සඳහා ඔබේ මනාපය අනුව **අවම වශයෙන් කොටු 12ක් ඔබ අංකනය කළ යුතුය.** රේඛාවට පහළින් කැමති කොටු ප්‍රමාණයක ඔබට මනාප පරිදි දිගටම අංක ලකුණු කළ හැක.




චන්ද පත්‍රිකා නියැදිය

**අත්වැරැද්දක් සිදුවුවද කලබල නොවන්න.**

ඔබට නව චන්ද පත්‍රිකාවක් ඉල්ලාගෙන මුල සිට පටන්ගත හැකිය.

# **ඔබේ නිල උපදෙස් පෙළ** 2025 මහ මැතිවරණය සඳහා
## 2025 මැයි මස 3 වන සෙනසුරාදා

# මේ උපදෙස් පෙලෙහි **විකල්ප ආකෘතීන්**

### ලබාගත හැකි ආකෘතීන් පිළිබඳ තොරතුරු

දෘෂ්‍යාබාධිත හෝ අඩු පෙනීමක් ඇති ඡන්දදායකයින් සඳහා, මෙම නිල මාර්ගෝපදේශය AEC වෙබ් අඩවියේ විශාල මුද්‍රිත, e-text සහ ශ්‍රව්‍ය ගොනු වශයෙන් **aec.gov.au/assistance** වෙතින් ලබාගත හැක.

මෙම ආකෘති මෙන්ම බ්‍රේල් ද **13 23 26** අංකයට දුරකථන ඇමතුමක් ලබා දීමෙන් ඉල්ලා සිටිය හැක.

ඔබට ශ්‍රව්‍යාබාධ හෝ යම් ශ්‍රව්‍ය ආබාධයක් ඇත් නම් National Relay Service (NRS) හරහා අප අමතන්න.ඔබ කැමති ඇමතුම් නාලිකාව භාවිතා කර අපගේ **13 23 26** අංකය NRS වෙත ලබා දෙන්න.

Auslan භාෂණ පරිවර්තන සේවාවන්ද ලබාගත හැක. තවදුරටත් තොරතුරු සඳහා AEC වෙබ් අඩවියට පිවිසෙන්න.




### අනෙකුත් භාෂාවලින් තොරතුරු

මේ උපදෙස් පෙලෙහි භාෂා 34 ක පරිවර්තිත පිටපත් **aec.gov.au/translated** වෙතින් බාගත කල හැක.

දුරකතන භාෂණ පරිවර්තන සේවාවන්ද ඇත. චන්දය භාවිතා කිරීම සහ මැතිවරණ පිළිබඳව සිංහල භාෂාවෙන් තොරතුරු ලබාගැනීමට **1300 720 153** අමතන්න.

වයස අවුරුදු 18ට හා ඊට වැඩි ඔස්ටේලියානු පුරවැසියන් චන්දය භාවිතා කිරීම අනිවාර්යය වේ. ඔබ චන්දය භාවිතා නොකලහොත්, ඔබට විරුද්ධව නඩු පැවරිය හැක. වරකට වඩා චන්දය භාවිතා කිරීම අපරාධ වරදකි.

24-2017

**aec.gov.au** 13 23 26

AEC Australian Electoral Commission

මැතිවරණ කොමසාරිස්වරයා ගේ අනුමැතිය පරිදිය, 10 Mort Street, Canberra
Authorised by the Electoral Commissioner, 10 Mort Street, Canberra